# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් පුරප්පාඩු

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත පිරිමි පක්ෂයෙන් පමණක් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩය 2 ( ඒ - 2- 1 -2016) - කොන්ත්‍රාත් පදනම

**අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුලුව විෂයන් 04කට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ,

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, ගණිත විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

**තාක්ෂණික නිපුණතා/ප්‍රවීණතා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව මොරටුව විශ්ව විද්‍යාලය (NDT), ඉංජිනේරු තාක්ෂණ ආයතනය (කටුනායක) NET, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (HNDT) ආයතනයකින් හෝ ලබා ගත් ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සහ වසර 01 ක රජයේ පිළිගත් වාහිජ ආයතනයක නිෂ්පාදන හෝ ඉංජිනේරු අංශයේ පළපුරුද්ද ලබා තිබීම. හෝ තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නා වු තාක්ෂණික (යාන්ත්‍රික ඉංජිනේරු පිළිබඳ) පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2 තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වියයුතුය.
3 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
4 සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10%ක් දැරිය යුතු අතර සමාගම විසින් ඒ සඳහා 15%ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් දරනු ලැබේ.
5 වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.
6 රාත්‍රී වැඩමුර ක්‍රියාත්මක වේ.

**අයදුම්පත් තමා විසින් ම සකස් කොට සියළු තොරතුරු හා සුදුසුකම් ඇතුලත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අදාල අයදුම්පත් 2024.04.10 වන දිනට පෙර ලියා පදිංචි තැපැල් මගින් පමණක් පහත ලිපිනයට එවිය යුතුය.**

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති), ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, තැ.පෙ 17, කපුවත්ත, ජා-ඇල**

අඩ සියවසක මතකයේ රැඳි රසය